# A review of the concept of consciousness depicted early Buddhism

## මුල් බුදුසමයේ දැක්වෙන විඤ්ඤාණ සංකල්පය පිළිබඳ සමාලෝචනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

"විඤ්ඤාණය" යන පදය බුදුසමයෙහි මනෝ විද්‍යාත්මක සංකල්ප යටතේත්, පාරභෞතික සංකල්ප යටතේත් විග්‍රහ වන්නා වූ පාරිභාෂික පදයකි. විශේෂයෙන් බෞද්ධ මනෝවිද්‍යාත්මක සංකල්ප යටතේ මෙය බොහෝ සෙයින් දැක ගත හැකි අතර, ඒ තුළින් සංකීර්ණ වූ අර්ථයන් ගම්‍යමාන වේ. සිත හැඳින්වීම සඳහා යෙදුණ "මනො" යන පදය තුළින් ඉන්ද්‍රිය අර්ථය නියෝජනය කරනවා සේම "චිත්ත" යන පදය තුළින් භාවාර්ථය නියෝජනය කරනවා සේම "විඤ්ඤාණය" යන පදය තුළින් ද සිතේ සුවිශේෂී වූ පැතිකඩක් නියෝජනය කරන ලබයි. මහාවේදල්ල සූත්‍රයට අනුව "විඤ්ඤාණ" යන පදය තුළින් ප්‍රජානනය, දැනීම, අවබෝධය යන මානුෂික තත්වයක් අර්ථවත් කරනු ලබයි. "දන්නේය, දන්නේය යනුවෙන් යම් හේතුවක් වේද, එහෙයින් විඤ්ඤාණය යැයි කියනු ලබෙයි.[1] කුමක් පිළිබඳ දැනගනී ද යත්, ස්පර්ශික වස්තුවේ වූ ඇඹුල, තිත්ත, කටුක, මධුර, කර රස, ලුණු රස ආදි වශයෙන් ද්‍රව්‍යයන්ගේ ස්වභාවයන් විඤ්ඤාණය තුළින් සංජානනය කරනු ලබයි."[2] මින් ප්‍රකට කරන අරුත ඉන්ද්‍රියන් ඇසුරෙන් ලබාගන්නා වූ දැනුමක් බව පෙනේ. මේ දැනීම කරණ කොටගෙන අන්තර් සම්බන්ධතාවන් නිර්මාණය වේ. එනම් අරමුණත් ඉන්ද්‍රියයත් අතර ඇති සම්බන්ධතාවයි. මෙම සබඳතාවය පදනම් කොටගෙන විඤ්ඤාණයාගේ පහළ වීම සිදු වේ. "ඉන්ද්‍රියයන්ගේ නොපිරිහුණු බව, බාහිර අරමුණු ඇතිවීම, මානසික අවධානය යොමු වීම යන කරුණු පූර්ණත්වයෙන් විඤ්ඤාණයාගේ පහළ වීම සිදු වේ.[3] මීට අමතරව බෞද්ධ ධර්ම සාහිත්‍යය පිළිබඳ විමසීමේදී "විඤ්ඤාණ" යන පදයේ භාවිතයන් දැක්වෙන විවිධ වූ අරුත් උසුලන්නා වූ අවස්ථා කීපයක්ම දැකගත හැකි වේ.

---

[1] විඤ්ඤාණං විඤ්ඤාණන්ති ආවුසො වුච්චති. කිත්තාවතානු බො ආවුසො විඤ්ඤාණන්ති වුච්චති. විජානාති විජානාතීති බො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති.

ම.නි. මහාවේදල්ල සූත්‍රය, 2003, බු.ජ.මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 686.

[2] කිඤ්චි විජානාති ආම්බලම් විජානාති තිත්කම්පි විජානාති කටුකම්පි විජානාති මධුරකම්පි විජානාති ඛාරිකම්පි විජානාති අඛාරිකම්පි විජානාති ලොණිකම්පි විජානාති අලොණිකම්පි විජානාති විජානාති බො භික්ඛවෙ තස්මා විඤ්ඤාණන්ති වුච්චති.

සං.නි. 03 ඛන්ධ වග්ගය, ඛජ්ජනීය සූත්‍රය, බු.ජ.මු.ත්‍රි.ග.මා. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පි. 150.

[3] අජ්ඣත්තිකො තෙ ආවුසො මනො අපරිභින්නං හොති. බාහිරා ච ධම්මා ආපාතං ආගච්ඡන්ති. නො ච තජ්ජොව සමන්නාහාරො හොති. නෙවතාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති.

ම.නි., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත, බු.ජ.මු.

- ❖ පඤ්චස්කන්ධ ධර්මයන් අතරෙහි ස්කන්ධ ධර්මයක් ලෙස
- ❖ අටලොස් ධාතු විග්‍රහයේදී ඉන්ද්‍රීය ඥාණයක් ලෙස
- ❖ හේතු - ඵල ධර්මතාව හා බැඳුණු තත්වයක් ලෙස
- ❖ ප්‍රතිසන්ධි ක්‍රියාවලිය හා බැඳුණු තත්වයක් ලෙස

මෙම සියලු අවස්ථා තුළ "විඤ්ඤාණය" යන්න විවිධ වූ අරුත් ගෙන ඇති බව පැහැදිලිව දැකගත හැකිය. මේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගැනීම සඳහා විඤ්ඤාණය යන්නෙහි පදගතාර්ථයන් විමසා බැලීම වටී. වාග් විද්‍යාත්මකව මෙම පදය "වි" පූර්ව "ඥාණ" ධාතුවෙන් නිර්මාණය වන අතර, "වි" යන්නෙන් බෙදීම, වෙන් කිරීම යන අරුත් හැඟවෙන නිසා විඤ්ඤාණය යන්නෙන් "බාහිර ලෝකයෙන් විෂය වස්තුව වෙන්කර හඟියි" යන්න අදහස් වන බව දැක්විය හැකිය. බෞද්ධ සූත්‍ර දේශනා තුළ විඤ්ඤාණ යන්න සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ වශයෙන් දැනගන්නා බව හා විවිධ රස වෙන්කර හැඳිනගන්නා බව යනුවෙන් අරුත් ගන්වා ඇත.[4] බාහිර ලෝකයේ විෂය අරමුණු ලැබුණු විට ඒවායේ මූලික ස්වාභාවය වෙන්ව දැනෙන මට්ටමට සංවේදී වීම මෙයින් අදහස් කර ඇත. විඤ්ඤණය යන්න පිරිසිදු කළයුතු හෝ දියුණු කළ යුතු බවට සඳහනක් සූත්‍ර සාහිත්‍යයේ හමුවන්නේ නැත. සිතේ දියුණුව පිරිසිදු බව ගැන සාකච්ඡා කරන විට යොදන්නේ "චිත්ත" යනපදයයි. විඤ්ඤාණය පිළිබඳ කළ යුතු කාර්යය වන්නේ එය පරිජානනීය කළ යුතු බවයි.[5] විඤ්ඤාණය සැම විටම ෂඩේන්ද්‍රියයන් හරහා ක්‍රියාත්මක වන බව දක්වා ඇත. විඤ්ඤාණය විස්තරාත්මකව දක්වන සැමවිටම එය චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ ආදි වශයෙන් ඉඳුරන් ඇසුරෙන් පෙන්වා ඇත. විඤ්ඤාණයේ දැක්වෙන ස්වරූප හයක් "ඡ විඤ්ඤාණ කාය" ලෙස හැඳින්වේ.[6] එසේම "විඤ්ඤාණය" යන්න එක් භවයකින් තවත් භවයකට ප්‍රතිසන්ධිවීමේ දී සම්බන්ධිකාරකය ලෙස ක්‍රියාත්මක වේ. දී.නි. සම්පසාදනීය සූත්‍රයෙහි සඳහන් ආකාරයට සත්වයාගේ විඤ්ඤාණය දෙපසින්ම නොසිඳුණු නොවියැලුණු දිය දහරක් සේ පූර්ව භවයත් වර්තමාන භවයත් අනාගත භවයත් ස්පර්ශ කොටගෙන පවත්නා බව දක්වයි.[7] එසේම විඤ්ඤාණයක් මව් කුසට බැස නොගන්නේ නම් එහි නාම-රූප නොවැඩෙන බව මහානිදාන සූත්‍රයෙහි විග්‍රහ වේ.[8] එසේම විඤ්ඤාණාහාරය අනාගතයේ පුනර්භවය සඳහා ප්‍රත්‍යකාරකය ද වේ.[9] මෙහි දී විමුක්ත වූ පුද්ගලයාගේ විඤ්ඤාණය නැවත පහල වීමක් නොවන බැවින්

---

[4] ම.නි. I, බු.ජ.මු.ත්‍රි.ග්‍ර. පි. 292.

[5] විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං

ම.නි. I. බු.ජ.මු. පි. 292.

[6] සං.නි. III, බු.ජ.මු., පි. 100.

[7] පුරිසස්ස විඤ්ඤාණ සොතං උභතො අබ්බොච්ඡින්නං ඉධ ලොකෙ පතිට්ඨිතං ච පරලොකෙ පතිට්ඨිතං ච

දී.නි. සම්පසාදනීය සූත්‍රය. බු.ජ.මු., III පි. 170.

[8] දී.නි. II බු.ජ.මු. පි., 92.

[9] විඤ්ඤාණාහාරො ආයතිං පුනභාවාභිනිබ්බත්තියා පච්චයො.

පරිනිර්වාණයට පත්වන බව දැක්වේ.[10] සංයුක්ත නිකායේ සගාථක වර්ගයෙන් මෙම අදහස පැහැදිලිව ප්‍රකාශකොට තිබේ. එනම් අප්පතිට්ඨිත විඤ්ඤාණයෙන් හෙවත් උපාදානයෙන් ගිලිහීම නිසා තවදුරටත් මෙලොව නොපිහිටි විඤ්ඤාණයෙන් ගෝධික නම් තෙරුන් වහන්සේ මිය පරලොව ගිය බවයි. එවැන්නෙක් සම්බන්ධයෙන් ප්‍රකාශ වන්නේ මිය පරලොව යාමක් නොව පරිනිර්වාණයට පත් වූ බවයි. උපාදානයෙන් බැඳී සිටින සියල්ලන් දැඩව පිහිටි විඤ්ඤාණයෙන් මියපරලොව යන්නේ ඊළඟ භවයකට විඤ්ඤාණයේ උරුමකම හෙවත් හිමිකම ඇතිවය. එහෙත් එසේ නොපිහිටි විඤ්ඤාණයෙන් හෙවත් කෙලෙස් බැම්වලින් මිදී උපාදානයෙන් ද තොර වූ යමෙක් නිවනට පත්වන්නේ උප්පත්තිකාරක ප්‍රතිසන්ධි විඤ්ඤාණය ශුන්‍ය බවට පත් කිරීමෙනි. නාම-රූප නිරෝධයෙන් විඤ්ඤාණය නිරෝධය ද, විඤ්ඤාණ නිරෝධයෙන් සළායතන නිරෝධය ද, සළායතන නිරෝධයෙන් ස්පර්ශයන්ගේ නිරෝධය ද යනාදි වශයෙන් සියලු භවගාමි පැවැත්මේ නිරෝධය සිදු වේ.[11] සං.නි. විඤ්ඤාණ සූත්‍රය තුළ බුදුරජාණන් වහන්සේ දක්වන්නේ විඤ්ඤාණය පිළිබඳ යථා තත්වය නොදන්නා වූ ද විඤ්ඤාණ සමුදය, විඤ්ඤාණ නිරෝධය සහ විඤ්ඤාණ නිරෝධගාමිණී පටිපදාව නොදන්නා පුද්ගලයන් විසින් ඒ පිළිබඳව යථාර්ථාවබෝධය ලැබීම පිණිස ශාස්තෘවරුන් සෙවීම කරනු ලැබිය යුතු බවයි.[12] විඤ්ඤාණය පිළිබඳ යථාවබෝධය ලැබීම විඤ්ඤාණ නිරෝධයට හෙවත් විමුක්තියට මාර්ගයයි. අස්සුතවත්‍ථු සූත්‍රයේ දැක්වෙන ආකාරයට චිත්ත, මනො, විඤ්ඤාණ යන නම්වලින් හඳුන්වන තත්වය මේ අශ්‍රුතවත් පෘථුජ්ජනයෙකු ස්ථාවරව පවතීයැයි ගැනීම කිසිසේත් නොකළ යුතු බව දක්වා ඇත.[13] සං.නි. අභිසමය සංයුක්තයේ විඤ්ඤාණය යන වචනයේ තවත් අර්ථ ස්වරූපයක් දක්වා ඇත. එයට අනුව සංයෝජන ධර්මයන්හි ආස්වාදය අනුපස්සනාවෙහි යෙදෙමින් (අගය කරමින්) ජීවත්වන්නහුගේ විඤ්ඤාණය නැවත භවයකට බැස ගනී. "විඤ්ඤාණය නැවත නැවත වෙයි. ඔහු සසරට බැස ගනී. විඤ්ඤාණය ප්‍රත්‍යකොටගෙන නාම-රූප ධර්මයෙන් තොරව විඤ්ඤාණයාගේ හටගැනීමක් නොමැත. සංයෝජන ධර්මයන්හි ආදීනව දකිමින් වෙසෙන්නහුට විඤ්ඤාණ නිරෝධය වේ. එවිට නාම-රූප නිරෝධය වේ."[14]

---

සං.නි. II බු.ජ.මු. පි., 22

[10] අප්පතිට්ඨිත විඤ්ඤාණෙන පරිනිබ්බුතො

සං.නි. I බු.ජ.මු., පි. 222.

[11] ම.නි., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත, බු.ජ.මු.

[12] සං.නි. II බු.ජ.මු. පි. 204.

[13] සං.නි., නිදාන සංයුත්ත, මහා වග්ග, අස්සුතවාසුත්තවණ්ණනා, බු.ජ.මු.

[14] සඤ්ඤෝජනීයෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො විඤ්ඤාණස්ස අවක්කන්ති හොති. විඤ්ඤාණ පච්චයා නාමරූපං එවමෙත්තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. එවමෙතස්ස ඛො භික්ඛවෙ සඤ්ඤොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සී විහරතො විඤ්ඤාණස්ස අවක්කත්ති හොති.

සං.නි. II., බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිටු. 142 - 144.

මේ අනුව ශාස්තෘවරයෙකු වෙත එළඹිය යුත්තේ ද විඤ්ඤාණය පිළිබඳ අවබෝධය ලැබීම පිණිසය. විඤ්ඤාණය අවබෝධ කරන්නහුට එයම විඤ්ඤාණ නිරෝධය වේ.

මෙයට සමාන වූ අදහසක් දී.නි. සාමාඤ්ඤඵල සූත්‍රයෙහි ද දක්නට ලැබේ. "මේ ශරීරය සතර මහාභූත ධර්මයන්ගෙන් සැදුම් ලද්දකැයි ද, මව්පිය සබඳතාවෙන් හටගත්තකැයි ද, ආහාරයෙන් පෝෂණය වන්නක් යැයි ද, අනිත්‍ය වූද, පිරිමැදිය යුතු වූද, බිඳී විසිරී යන ස්වභාවයෙන් යුක්ත වූවකැයි ද, තමාගේ විඤ්ඤාණ ශක්තිය ඒ සිරුරෙහි ලැගගත්තේ යැයි ද, බැඳුනේ යැයි ද දැනගනී."[15] මෙහි දී නාමකාය - රූපකාය සම්බන්ධතාව සත්‍වයාගේ පැවැත්මට උපනිශ්‍රය වන ආකාරය පැහැදිලි වේ. එසේම රූපයෙහි ඡන්දය හෙවත් කැමැත්ත, ඇලීම, සතුටු වීම, තෘෂ්ණාව ඇතිකර ගැනීම වශයෙන් යම් මානසිකත්‍වයක් පවතී ද ඒ අනුව රූපයෙහි ඇලුනේ විශේෂයෙන් ඇලුනේ "සත්‍වයා" යැයි කියනු ලබයි.[16] සත්‍වයා භෞතික ශරීරයට සම්බන්ධ වන අවස්ථාව විඤ්ඤාණ ධාතුව මව්කුසට බැසගන්නා අවස්ථාව වේ. මෙහි විඤ්ඤාණ යනු පෙර භවයේ චුති අවස්ථාවේ වූ කර්මවිඤ්ඤාණය අනුව ප්‍රතිසන්ධි ඇතිකරවන විඤ්ඤාණයයි. (සංඛාර පච්චයා විඤ්ඤාණං) ඒ විඤ්ඤාණ ස්වභාවය අනුව නාම-රූප වැඩීම සිදු වේ. (විඤ්ඤාණ පච්චයා නාම-රූපං) නාම-රූප වලින් බැහැර නොවන විඤ්ඤාණය පෙරළා එහිම වැටේ. (නාම රූප පච්චයා විඤ්ඤාණං) උක්ත කාරණාව මහා නිදාන සූත්‍රයට අනුව මෙසේ දැක්විය හැක.

1. නාමකාය ප්‍රඥප්තිය නොවන්නේ නම්, රූප කායෙහි මනෝ ද්වාරික ස්පර්ශය (අධිවචන සම්ඵස්ස) නොවන්නේය.
2. රූපකාය ප්‍රඥප්තිය නොවන්නේ නම්, නාම කායෙහි පංච ද්වාරික ස්පර්ශ (පටිඝසම්පස්සය) නොවන්නේය.
3. නාමකායත්-රූප කායත් නොමැති නම්, මනෝ ද්වාරික ස්පර්ශය හෝ පඤ්චද්වාරික ස්පර්ශය නොවන්නේය.
4. නාම-රූප ප්‍රඥප්තිය නොමැති නම්, ඵස්සය නොපැනේ.
5. නාම-රූප ප්‍රඥප්තිය ඇති කල්හිම ස්පර්ශය පැනේ.
6. මව්කුස ප්‍රතිසන්ධි වශයෙන් විඤ්ඤාණය නොබසීනම් කලලය ඇසුරුකොට නාම-රූප නොවැඩේ.
7. විඤ්ඤාණය මව්කුසට ප්‍රතිසන්ධි වශයෙන් බැස නැවත බැහැර වේ නම්, නාම රූප නොවැඩේ.
8. මව්කුස ළදැරුවාගේ විඤ්ඤාණය සිඳේ නම්, නාම-රූප නොවැඩේ.
9. නාම-රූපයෙහි පිහිට නොලබන විඤ්ඤාණය ජාති, ජරා, මරණ, දුක් ප්‍රභව කරන්නේ නැත.

---

[15] අයං බො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මතාපෙත්තික සම්භවො ඔදනකුම්මාසූපච්චයො. අනිච්චූඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධං

දී.නි. I. සාමාවඤ්ඤඵල සූත්‍රය. බු.ජ.මු. පි. 132.

[16] රූපෙ බො රාධ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තත්‍ර සන්තො තත්‍ර විසත්තො තස්මා සත්තොති වුච්චති.

සං.නි. III සත්ත සූත්‍රය. බු.ජ.මු. පි. 342

.

10. නාම-රූපයෙහි පිහිට ලබන විඤ්ඤාණය ජාති, ජරා, මරණ, දුක් ප්‍රභව කරයි.

මෙසේ විඤ්ඤාණය නාම-රූප සමඟත්, නාම-රූප විඤ්ඤාණය සමඟත් අන්‍යොන්‍ය ප්‍රත්‍යවීම් වශයෙන් සංසාරය තුළ ප්‍රවර්තනය වන බව දැක්වේ.[17] මෙම කාරණාවන් පිළිබඳ විමසා බැලීමේ දී විඤ්ඤාණය යම් ස්ථාවර වූ පදාර්ථයක් ලෙස පිළිගැනීමට බොහෝ සේ ඉඩකඩ ඇත. බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයේ "සාති" භික්ෂුව විඤ්ඤාණය යම් ස්ථාවර වූ පදාර්ථයක් ලෙස අර්ථදක්වන්නට උත්සහගෙන ඇත. එහි දී බුදුරජාණන් වහන්සේ සාති භික්ෂුවගේ ආකල්පය ඍජුව ප්‍රතික්ෂේප කොට හේතු ප්‍රත්‍යයකින් තොරව විඤ්ඤාණය කිසිකලෙක හටනොගන්නා බව දැක්වූහ.[18] එසේම විඤ්ඤාණය පටිච්චසමුප්පන්ව ගලායන්නා වූ ප්‍රවාහයක් ලෙස දැක්වූහ.[19] විඤ්ඤාණයේ හටගැනීමට හා පැවැත්මට මුල් වන්නා වූ හේතු ප්‍රත්‍යයන් කවරේදැයි යන්න ඊළඟට පැනනැගෙන්නා වූ ගැටලුවකි. විඤ්ඤාණයේ ක්‍රියාත්මකභාවය සිදුවන්නේ ඉන්ද්‍රියයන් හරහාය. ඒ ඒ ඉන්ද්‍රියයන්ට අනුව විඤ්ඤාණය ඒ ඒ ස්වරූපයෙන් ක්‍රියාත්මක වේ. චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය ආදි වශයෙන් හැඳින්වෙන්නේ එම ස්වරූපයයි. මහාතණ්හාසංඛය සූත්‍රයේ ගින්න උපමාවට ගනිමින් විඤ්ඤාණයේ ඉන්ද්‍රිය බද්ධතාව පැහැදිලි කොට ඇත. ගින්න හැමවිටම තේරුම් ගත හැක්කේ ගිනි ගන්නා දේ අනුවය. තණ ගින්න, රොඩු ගින්න, ලී ගින්න ආදි ලෙස ගිනි ගන්නා දෙයක් පදනම් කරගෙන ගින්න ඇති වේ. ගිනි ගන්නා දෙයකින් තොරව හෙවත් දාහක ද්‍රව්‍යයකින් තොරව හුදු ගින්න කියා දෙයක් අර්ථවත්ව දැක්විය නොහැක. විඤ්ඤාණය ද එලෙස ඉන්ද්‍රිය ඇසුරෙන්ම උපදී. ඉන්ද්‍රියයන්ට සාපේක්ෂකව විඤ්ඤාණයාගේ ස්වාභාවය ද තීරණය වේ. දැනට ඇති ප්‍රමාණයට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් ඉන්ද්‍රියයන් අපට තිබුණේ නම් විඤ්ඤාණයේ ස්වරූපය ද ඒ අනුව වෙනස් වේ. විඤ්ඤාණයේ පහල වීමට ඉන්ද්‍රියයන් පමණක් නොව බාහිර අරමුණු ද බලපායි. අභ්‍යන්තර කායික ඉන්ද්‍රියයන් පදනම් කරගෙන විඤ්ඤාණය පහල වන්නේ බාහිර අරමුණක් කෙරෙහිය. ඇස නිසා රූපයෙහි චක්ඛු විඤ්ඤාණය පහල වේ.[20] ඒ අනුව බාහිර විෂය අරමුණු විඤ්ඤාණයේ පහලවීම හා ස්වභාවය කෙරෙහි බලපාන අයුරු පැහැදිලි ය. අභ්‍යන්තර කායික ඉන්ද්‍රියයන් හා බාහිර අරමුණු පදනම් කරගෙන විඤ්ඤාණය පහළ වුවත් එහි අඛණ්ඩ ප්‍රවාහාත්මක පැවැත්මට ඒවා ප්‍රමාණවත් නොමැත. විඤ්ඤාණ ප්‍රවාහය පෝෂණය කිරීම සඳහා තවත් සාධක තිබිය යුතුය. විශේෂයෙන් මනෝ විඤ්ඤාණ අවස්ථාවේ දී

---

[17] දී.නි. II මහානිදාන සූත්‍රය. බු.ජ.මු. පිටු. 90-92.

[18] අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො

ම.නි. I බු.ජ.මු., පි. 604.

[19] පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං

ම.නි. I බු.ජ.මු., පි. 608.

[20] චක්ඛුඤ් ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං

ම.නි. I. බු.ජ.මු., පි. 280.

විෂය අරමුණු වන්නේ බාහිර භෞතික වස්තුවක් නොව "ධම්මා" ලෙස දැක්වෙන අභ්‍යන්තර මානසික ධර්මයෝය. මේ අනුව විඤ්ඤාණයේ පැවැත්මට අභ්‍යන්තර මානසික ධර්මයෝ ද ඉවහල් වේ. "ධම්මා" ලෙස දැක්වෙන්නේ පූර්ව අත්දැකීම්, මතක සටහන්, සංකල්ප ඇසුරෙන් මතුවන සිතුවිලි ය. ඒවා විඤ්ඤාණයේ අඛණ්ඩ පැවැත්මට ඉන්ධන සපයයි. විඤ්ඤාණයේ පැවැත්ම පෝෂණය කරන මෙම මානසික ධර්මවලට පොදු නාමයක් ලෙසට "නාම" යන්න දැක්විය හැකිය. එය සූත්‍රවල විග්‍රහකර ඇත්තේ වේදනා සංඥා, චේතනා, ඵස්ස මනසිකාර ලෙසය.[21] මානසික අන්තර්ගතයන් ලෙස පවතින සටහන් තුළ නැඹුරුතා හා ශක්‍යතාවන් මේ පදවලින් හඳුන්වා ඇත. මෙහි දී විශේෂ කරුණක් වන්නේ " නාම" යන්න හැමවිටම තනි පදයක් ලෙසට නොව "රූප" යන පදයත් සමඟ එක්කොට "නාම-රූප" ලෙස දක්වා තිබීමයි. නාම ලෙස හැඳිනගත් මානසික ධර්මයන් හැමවිටම භෞතික හෝ කායික ඉන්ද්‍රියයන් ඇතුළත් කොට ඇති කායික පදනම විඤ්ඤාණයේ පැවැත්මට හේතු ප්‍රත්‍ය වේ. නැවත අනෙක් අතට මෙම නාම-රූප ධර්මයන් බිහි කිරීමට සහ සක්‍රීය කිරීමට විඤ්ඤාණයද ඒවාට හේතු ප්‍රත්‍ය වේ. නාමරූප කරණ කොට ගෙන විඤ්ඤාණය ක්‍රියාත්මක වීමත්, විඤ්ඤාණය කරණ කොටගෙන නාම-රූප ධර්මයන්ගේ වැඩීම සිදුවීමත් යන අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වය මහානිදාන සූත්‍රයේ මැනවින් පැහැදිලි කොට ඇත. "විඤ්ඤාණය ප්‍රත්‍ය කොටගෙන නාම-රූප පවතියි. නාම-රූප ප්‍රත්‍ය කොටගෙන විඤ්ඤාණය පවතියි."[22] මේ පිළිබඳව තවදුරටත් විමසීමේ දී සංයුක්ත නිකායේ නළකලාප සූත්‍රය තුළ මෙම නාම-රූප හා විඤ්ඤාණය අතර ඇති සබඳතාව, එහි ඇති අනිත්‍ය බව හා යැපෙනසුළු භාවය බට මිටි දෙකක් පදනම් කොට ගෙන විග්‍රහ කොට ඇත. "යම් සේ බට මිටි දෙකක් එකිනෙකට උපනිශ්‍රීයව තැබූ කල්හි ඒවා එකිනෙකට ප්‍රත්‍යව පවත්නා සේම නාම-රූප හා විඤ්ඤාණය එකිනෙකට අන්‍යොන්‍ය වශයෙන් බැඳී පවතියි."[23]

නාම-රූප ධර්මයයෝ අන්‍යොන්‍යව ප්‍රත්‍යව පවතින නමුත්, සූත්‍රාගත වර්ගීකරණයන් අනුව විඤ්ඤාණය නාම-රූපයේ කොටසක් ලෙස නොසැළකේ. ඒ තුළ ඇත්තේ අන්‍යොන්‍ය හේතුඵල සබඳතාවක බිහිවීමක් පමණි.[24] නමුත් "මහානිද්දේස" පාලියේ සහ බුද්ධඝෝෂ අටුවාවන්හි විඤ්ඤාණය

---

[21] සං.නි. II බු.ජමු., පි. 06.

[22] එසොවහෙතු එස පච්චයා විඤ්ඤාණස්ස. යදිදං නාම රූපං එසෙව හෙතු එස පච්චයො නාම රූපස්ස යදිදං විඤ්ඤාණං එත්තාවතා බො ආනන්ද ජයෙථ වා මීයෙථ වා මියෙථ වා උප්පජ්ජෙථ වා.

දී.නි. II බු.ජ.මු., පි. 82.

[23] සෙය්‍යථාපි ආවුසො ද්වෙ නළකලාපියො අඤ්ඤමඤ්ඤං උපනිස්සාය තිට්ඨෙය්‍යුං එවමෙව බො ආවුසො නාමරූප පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං

සං.නි. II, නළකලාප සුත්ත, පි. 180.

[24] විඤ්ඤාණෙ සති නාමරූපං හොති. විඤ්ඤාණ පච්චයා නාමරූපං නාමරූපෙ... සති විඤ්ඤාණං හොති. නාමරූප පච්චයා විඤ්ඤාණං

දී.නි. II, පි. 32.

ද, නාමයෙහි ලා ඇතුළත් සතර අරූපස්ඛන්ධයන් ද නාම යැයි සළකා ඇත.[25] මහානිදාන සූත්‍රයට අනුව නාමයෙහි ලා අන්තර්ගත වන ස්පර්ශය (ඵස්ස) ඇති කරවන්නේ නාම-රූපයන්ගෙනි.[26] මෙයින් හැගෙන්නේ නාම-රූප යන සමාස පදය යටතේ සංකල්පිතව පටිච්චසමුප්පාද මූලධර්මයෙහි යම් කාර්ය කොටසක් ඉටුකරන එම සාධකය (නාම-රූප) මුළුමනින්ම මානසික ස්වරූපයෙන් සංකල්පිත වූ ස්පර්ශය හා විඥානය යන අනෙකුත් ක්‍රියාවලීන් තීරණය කරමින් සාපේක්ෂක වශයෙන් ස්වාධීන වූ සංකීර්ණ ඒකකයක් සේ සිටින බවයි. සඤ්ඤා, විඤ්ඤාණ හා පඤ්ඤා වැනි මානසික සංකල්ප හා සම්බන්ධිත තැන්වල දී සූත්‍ර ධර්ම ඒවා අතර සියුම් වූ වෙනස්කම් දැක්වීමට උත්සහගෙන නොමැත. සත්‍ය වශයෙන්ම ඒවා තම ක්‍රියාකාරීත්වයේ දී යම් අයුරකින් එකිනෙක මත පැතිරී පවතී.[27] පුද්ගලත්වය දරා සිටින ආත්මමය ස්වභාවයේ නිත්‍ය වූ පදාර්ථයක් මුල් බුදුසමය නොපිළිගන්නා අතර, එවැනි පදාර්ථමය සත්තාවන් විඤ්ඤාණයෙහිලා ආරෝපණය කිරීමට ගන්නා ලද සෑම ප්‍රයත්නයක්ම ද මුල් බුදුසමයෙන් ප්‍රතික්ෂේප වී ඇත. ඒ සමඟම කර්මය හා පුනර්භවය අර්ථයෙන් සාංසාරික වූ ජීවිත පෙළ හරහා යන්නා වූ පුද්ගල අනන්‍යතාවයක් ආරෝපණය කිරීමේ භව්‍යතාව මුල් බුදුසමයෙන් පිළිගැනිණ. මෙය මුල් බුදුසමයෙහි එන සුවිශේෂී ලක්ෂණයක් බව ද පෙනේ. පැවැත්මෙහිලා මානසික හා භෞතික විෂයෙහි ඇති අන්‍යොන්‍ය සාපේක්ෂතාවය දක්වමින් මුල් බුදුසමය ඒකාන්ත ද්වෛතවාදය ද විඤ්ඤාණවාදි හා භෞතිකවාදි වන අද්වෛතවාදය ද යන අන්තගාමී දාර්ශනික මත දෙකෙන්ම ද දුරු වී ඇත. අරූපස්කන්ධය (අරූපිනො ඛන්ධා) වශයෙන් ගැනෙන මානසික ස්කන්ධයන් මෙන්ම රූපස්කන්ධය ද එක සේම වෙනස්වීමේ ස්වභාවයට යටත් වේ. මේ ස්කන්ධයන්ට අමතරව පුද්ගල පැවැත්මෙහි සාරය වශයෙන් ගත හැකි අන්‍ය වූ කිසිවක් නොමැත. පඤ්ඤාව හෝ විඤ්ඤාණය වැනි යම් බඳු මානසික ධර්මයක් සංචරක නිත්‍ය වූ ආත්මයක් සේ ගැනීමේ යම් උත්සහයක්වේ ද බුදුරජාණන් වහන්සේ එය එක හෙළාම ප්‍රතික්ෂේප කොට ඇත. බුදුරජාණන් වහන්සේ අවබෝධ කොටගෙන දේශනා කළ යථාර්ථය වූයේ පටිච්චසමුප්පාදයයි. එය බුදුදහමේ පදනම ලෙස දැක්වේ. එසේම එය ධර්ම කරුණු විග්‍රහ කරන්නා වූ න්‍යායයි. විඤ්ඤාණය ද පටිච්චසමුප්පාද න්‍යාය මත පදනම්ව පාලි මූලාශ්‍රය තුළ විග්‍රහ වී ඇත. ද්වාදසාංග පටිච්චසමුප්පාදයේ දී ***"සංඛාර පච්චයා විඤ්ඤාණං"*** යන්නෙන් වර්තමාන භවයෙහි ප්‍රතිසන්ධි ග්‍රහණය අර්ථවත් වේ. ප්‍රතිසන්ධිය මඟින් නාම-රූප ධර්මයන්ගේ පහළවීම සිදු වේ. විඤ්ඤාණයෙහි සම්භවය නාමරූප ධර්ම ප්‍රත්‍ය කොටගෙන සිදුවේ. එසේ යමක් ප්‍රත්‍යකොට යමක් පහළ වෙයි ද එය ප්‍රතීත්‍යසමුප්පාද ධර්මතාවයයි. බුදුරජාණන් වහන්සේ විසින්ම විඥානයෙහි ප්‍රතීත්‍යසමුප්පන්නභාවයසනාථ කළ අයුරු දී.නි. මහාතණ්හා සංඛය සූත්‍රයෙන් පැහැදිලි වේ. "භාග්‍යවතුන් වහන්සේ විසින් අපට විඥානය ප්‍රතීත්‍යසමුප්පන්න යැයි ද ප්‍රත්‍යයන්ගෙන් තොරව විඥානයාගේ

---

[25] මහානිද්දේස පාලි II, පි. 435.

[26] දී.නි. II, පි. 56.

[27] න සක්කා විනිබ්භුජ්ජිවා විනිබ්භුජ්ජිවා නානාකරණං පඤ්ඤපෙතුං

ම.නි. I. පි. 292.

සම්භවය සම්භවයක් නැතැයි දේශනා කරන ලදී.[28] විඤ්ඤාණයාගේ සම්භවය හේතු ප්‍රත්‍ය ඇතිකල ඇතිවන අයුරු ගින්නක උපමාවකින් ද පැහැදිලි කොට ඇත. "මහණෙනි ප්‍රත්‍යය නිසා ගින්න දිලේ ද එම ගින්න ඒ ඒ ප්‍රත්‍යයන්ගේ නාමයෙන් හඳුන්වයි. කෘෂ්ඨ දර තුළින් ගින්න දිලේ ද එය කෘෂ්ඨ අග්නිය නමින් ද, සකලිකා (කටපොත-ලී කැබලි) එය "තෘණාග්නිය" නමින් ද, ගොම නිසා ගින්න දිලේ ද එය "ගොමයාග්නිය" නමින් ද, තුස හෙවත් දහයියා නිසා ගින්න දිලේ ද එය "තුසාග්නිය" නමින් ද, සඞ්කර හෙවත් කසල නිසා ගින්න දිලේ ද එය "සඞ්කරාග්නිය" නමින් ද ව්‍යවහාර කරයි. මහණෙනි, එපරිද්දෙන්ම යම් ප්‍රත්‍යයක් නිසා විඥානය උපදී ද ඒ ප්‍රත්‍ය නාමයෙන් විඤ්ඤාණය නාමකරණය වේ.[29]

මීට අමතරව විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය වේගවත් මෙන්ම අනිත්‍ය බව ද අස්සුතවත්ථු සූත්‍රයේ වඳුරකුගේ උපමාවකින් පැහැදිලි කොට ඇත. "මහණෙනි, වඳුරෙකු මහ වනයේ හැසිරෙනුයේ, යම් සේ අත්තක එල්බ ගනී ද එය මුදා අනිත් අත්තක් එල්බ ගනී ද මහණෙනි එලෙසින්ම යමක් සිත යැයි මනස යැයි විඤ්ඤාණය යැයි කියනු ලබයි ද ඒ මානසික වූ පදාර්ථය රෑ ද දහවල් ද අනෙකක්ම උපදියි. අනෙකක්ම නිරුද්ධ වේ."[30] මෙම දේශනාව මගින් භෞතිකය සංජානනය කරනු ලබන විඤ්ඤාණයේ ශීඝ්‍ර ක්‍රියාකාරීත්වය ඉස්මතු කරයි. උපමා කරනු ලබන වඳුරා එක් අත්තක් අතහැර අනෙක් අත්තෙහි එල්බ ගන්නා විට හස්තය අත්තෙන් මිදෙන්නාක් මෙන් විඤ්ඤාණය ද එල්බගත් ආරම්මණයෙන් මිදී තවත් ආරම්මණයක එල්බ ගනී. එය එක් අරමුණක නොපවතියි. මොහොතින් මොහොත අරමුණු සොයා ක්‍රියාත්මක වේ. එම සූත්‍ර පාඨය තුළින් අනිත්‍ය ස්වභාවයක්, ක්‍ෂණික පැවැත්මක් විඤ්ඤාණය තුළ පවතින බව අවධාරණය වේ. සං.නි. තුළ ස්ඛන්ධ ධර්මයන්ගේ ස්වභාවය විග්‍රහ කරන්නා වූ අවස්ථාව තුළදී ද විඤ්ඤාණයේ ස්වරූපය ලෙස දක්වා ඇත්තේ මායාවක් ලෙසිනි. (***මායූපමංච විඤ්ඤාණං***)[31]

---

[28] අනෙක පරියායෙනහි බො භික්ඛවෙ පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං මයා අඤ්ඤත්‍ර පච්චයා නත්‍ථි විඤ්ඤාණස්ස සම්භවො

ම.නි., යමක වග්ගය. මහා තණ්හාසංඛය සූත්‍රය. බු.ජ.මු., පිටු. 606 - 607.

[29] සෙය්‍යථාපි භික්ඛවෙ යඤ්ඤදේව පච්චයං පටිච්ච අග්ගි ජලති තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. කට්ඨංච පටිච්ච අග්ගි ජලති කට්ඨග්ගිතෙව සංඛං ගච්ඡති. සකලිකඤ්ච පටිච්ච අග්ගි ජලති සකලිකග්ගනෙව සඞ්ඛං ගච්ඡති. තිණඤ්ච පටිච්ච අග්ගි ජලති තිණග්ගිනෙව සඞ්ඛං ගච්ඡති. ගොමයඤ්ච පටිච්ච අග්ගි ජලති ගොමයග්ගිනෙව සඞ්ඛං ගච්ඡති. ථුසඤ්ච පටිච්ච අග්ගි ජලති ථුසග්ගිනෙව සඞ්ඛං ගච්ඡති. සඞ්කාරංච පටිච්ච අග්ගජලති සඞ්කාරග්නිනෙව සඞ්ඛං ගච්ඡති. එව මෙව බො භික්ඛවෙ යඤ්ඤදේව පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති.

ම.නි. I. මහායමක වග්ගය, මහාතණ්හා සංඛය සූත්‍රය, බු.ජ.මු., පිටු. 608 - 609.

[30] සෙය්‍යථාපි භික්ඛවෙ මක්කටො අරඤ්ඤපවනෙ චරමානො සාඛං ගන්හාති. තං මුඤ්චිත්‍වා අඤ්ඤං ගන්හාති. එවමෙව බො භික්ඛවෙ යදිදං වුච්චති ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං ඉතිපි චිත්තං තං රත්තියා ච දිවා පස්සච අඤ්ඤදෙව උප්පජ්ජති. අඤ්ඤං නිරුජ්ඣති.

සං.නි. II,අභිසමය සංයුක්තය, අස්සුතවත්ථු සූත්‍රය, බු.ජ.මු., පි. 148.

[31] ඵෙණපිණ්ඩූපමං රූපං - වේදනා බුබ්බුලොපමා<br>
මරීචි කූපමා සඤ්ඤා - සංඛාරා කදලූපමා<br>
මායූපමංච විඤ්ඤාණං - දෙසිතා දිච්ච බන්ධුනා

සං.නි. III,ඵේණපිණ්ඩූපම සූත්‍රය, බු.ජ.මු., පි. 244.

මෙම කාරණාවන්ට අමතරව දැකිය නොහැකිවූත්, අනන්තවූත් විඤ්ඤාණයක් පිළිබඳ උදානපාලියේ ගාථාවකින් දැක්වේ.[32] මේ කරුණම ම.නි. බ්‍රහ්මනිමන්තික සූත්‍රයෙන් ඉතා දීර්ඝ ලෙස සාකච්ඡාවට ලක් වී ඇති අයුරු දැකගත හැකිය.[33] එසේම සංසාරික සියලු දුක්ඛයන් විඥානය ප්‍රත්‍ය කොටගෙන නිර්මාණය වන බව ආදි බුදුදහමේ ඉගැන්වීමයි. එම විඤ්ඤාණය භවයෙහි පැවැත්මෙන් නිරුද්ධ වූ කළ සියලු දුක්ඛයන්ගෙන් අත්මිදෙන බව සඳහන් වේ.[34] විඤ්ඤාණ ධාතුව පිළිබඳව රාගය ප්‍රහීන වේද රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණු සිඳෙයි. කර්ම විඤ්ඤාණයාගේ පිහිටීමක් නොවෙයි. නොපිහිටි එම විඤ්ඤාණය වැඩීමක් සිදු නොවෙනුයේ ප්‍රතිසන්ධි අභිසංස්කරණයෙන් මිදුනේ වෙයි. විමුක්ත හෙයින් ත්‍රස්ත නොවේ. ත්‍රස්ත නොවූයේ තමා කෙරෙහි පිරිනිවෙයි. ජාතිය ක්‍ෂය වෙයි. බඹසර බැස නිමවෙයි. කළ යුතු කාර්යය අවසන් වෙයි. තෙල අනුපදා පරිනිර්වාණය පිණිස කළයුතු අන් කිසිවක් නැතැයි දැනගනී.[35] මෙම දේශනාව තුළින් අර්හත්වය දක්වා වූ සාංසාරික ගමන විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයෙන් සිදුවන බව සඳහන් කරයි. අරහත්‍වය යනු භව නිරෝධයයි. අරහත්‍වයට පත් වූ පසු විඤ්ඤාණයෙහි ක්‍රියාකාරීත්වයට පිහිටක් නොමැත. කෙලෙසුන් ක්‍ෂය විය. එවිට විඤ්ඤාණය භවයෙහි නොපිහිටයි. එනම් එය අප්පතිට්ඨිත විඤ්ඤාණය හෙවත් භවයෙහි නොපිහිටි විඤ්ඤාණය බවට පත්වෙයි.[36] රහතුන්ගේ විඤ්ඤාණය ප්‍රහීන වූවක් ලෙස දැක්වේ. රාගාදියෙන් විනිර්මුක්ත වූ අවසන් විඤ්ඤාණය "කර්ම විඤ්ඤාණය" හා "අභිසංඛාර විඤ්ඤාණය" ලෙස දීඝ නිකායට්ඨකතාවෙහි සඳහන් වේ.[37] මේ පිළිබඳව අටුවා විවරණ විමසීමේ දී අරහත්‍වය තුළ විකාශයට හෙවත් උපච්ඡේදයට පත්වීමක්

---

[32] විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතොපභං
එත්ථ ආපොච පඨවි - තෙජො වායො න ගාධති

දී.නි., සීලකඛන්ධවග්ගපාළි, කෙවට්ට සුත්ත. බු.ජ.මු.

[33] විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පභං තං පඨවියා පඨවත්තෙන අනනුභූතං ආපස්ස ආපත්තෙන අනනුභූතං තෙජස්ස තෙජත්තෙන අනනුභූතං වායස්ස වායත්තෙන අනනුභූතං භූතානං භූතත්තෙන අනනුභූතං දේවානං දෙවත්තෙන අනනුභූතං පජාපතිස්ස පජාපතිත්තෙන අනනුභූතං බ්‍රහ්මස්ස බ්‍රහ්මත්තෙන අනනුභූතං ආභස්සරානං ආභස්සරත්තෙන අනනුභූතං සුභකිණ්ණභානං සුභකිණ්හත්තෙන අනනුභූතං. වෙහප්ඵලානං වෙහප්ඵලත්තෙන අනනුභූතං. අභිභූස්ස අභිභූත්තෙන අනනුභූතං සබ්බස්ස සබ්බත්තෙන අනනුභූතං

ම.නි., චූළයමක වග්ග, බ්‍රහ්මනිමිත්ත සුත්ත, බු.ජ.මු., පි. 770.

[34] යං කිඤ්චි දුක්ඛං සම්භොති - සබ්බං විඤ්ඤාණ පච්චයා
විඤ්ඤාණස්ස නිරොධෙන - නත්ථි දුක්ඛස්ස සම්භවො

බු.නි., සුත්ත නිපාතය, 737 ගාථා. බු.ජ.මු., පි. 228.

[35] විඤ්ඤාණ ධාතුයා භික්ඛවෙ භික්ඛුනො රාගො පහීනො හොති. රාගස්සපහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං අනභිසඞ්ඛච්ච විමුත්තං විමුත්තත්තායෙව පරිනිබ්බායති. ඛීණාජාති වුසිතං බ්‍රහ්මචරියං කතකරණීයං නාපරං ඉත්තත්තායාති පජානාති.

සං.නි., iii, ඛන්ධසංයුත්ත, උපස සුත්ත, බු.ජ.මු., පි. 96.

[36] අප්පතිට්ඨිතෙව භික්ඛවෙ විඤ්ඤාණෙන වක්කලි කුලපුත්තො පරිනිබ්බුතොති.

සං.නි. III, ඛන්ධ වග්ගය. වක්කලි සුත්ත. බු.ජ.මු., පි. 214.

[37] විඤ්ඤාණස්ස නිරොධෙන එත්තෙතං උපරුජ්ඣතීති ආහ.

වශයෙන් අර්ථ දක්වයි.[38] මේ සඳහා වන්නා වූ මාර්ගයක් ලෙස ආදි බුදුසමයේ දැක්වෙන්නේ සමාධිය වර්ධනය කිරීමයි. ම.නි. සමාධියෙහි අවස්ථා තුනක් (03) දක්වයි. පසිඳුරන්ගෙන් වෙන්ව පිරිසිදු වූ විඤ්ඤාණයෙන් ලබන්නා වූ ආකාසානඤ්චායතනය, විඤ්ඤානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය එම අවස්ථා තුනයි.[39] මෙම අවස්ථාවන්ගෙන් අනතුරුව උසස්ම අවස්ථාව වන සඤ්ඤාවේදයිතනිරොධ සමාපත්තියේ දී යෝගාවචරයා සඤ්ඤාවෙන් හා වේදනාවෙන් නිදහස් වෙයි. එහෙයින් ඔහු බොහෝවිට විඤ්ඤාණයෙහි සියලු ආවීර්ණතාවලින් අන්තර්ගතවලින් නිදහස් වෙයි. භික්ෂුවක් සමාධියෙන් නැගී සිටි විට තවදුරටත් ඔහුගේ ආශ්‍රව මතු නොවන නමුත් පෞරුෂ සාධක තවදුරටත් පවතියි. රහතන් වහන්සේ පිරිනිවන්පාන අවස්ථාව් දී මේවා විසිරී යයි. එහෙත් රැස් කිරීමක් නොපවතී. "එහි පඨවි ආපො තෙජො වායො නොපවතියි. එහි දික්වූවක් හෝ කෙටි වූවක් හෝ කුඩා වූවක් හෝ මහත් වූවක් හෝ සුභ වූවක් හෝ අසුභ වූවක් හෝ නොමැත. එහි නාමය ද රූපය ද ශේෂ වීමකින් තොරව නිරුද්ධ වෙයි.[40] මේ ආකාරයෙන් විඤ්ඤාණය පිරිසිදු භාවයට පත්වෙයි. ඝන ක්‍රියාවලි සංඛ්‍යාව අවම ප්‍රමාණයක් කරා පරිවර්තනය කරනු ලබයි. මෙහි ඒකත්වයක් නොමැත. වෛරාග්‍යය ඇත. පරාධීනත්වයක් නොමැත. එය නිදර්ශනවලින් නිදහස්ය. අන්තවලින් තොරය. හාත්පසින් විහිදෙයි.[41]

මීට අමතරව ම.නි. තුළ විඤ්ඤාණය අභ්‍යන්තර වූ ආකාශය ලෙස ද දක්වා ඇත. දෑස් පියාගෙන යම් දෙයක් පිළිබඳ කල්පනා කළහොත් අප ඒ තුළ නිර්මාණය කරගනු ලබන්නේ විඤ්ඤාණයේ අභ්‍යන්තර ආකාශයයි. ඒ තුළ වස්තූන් පිළිබඳ විනිවිද යාමට හැකියාවක් ද ඇත. ම.නි. තුළ දැක්වෙන පඨවි, ආපො, තෙජො, වායො, ආකාස හා විඤ්ඤාණ යන ධාතු සය පිළිබඳ විමසීමේ දී ඒවායේ අනුපිළිවෙළ අනුව දළ හා ඝන දේවල්වලින් ආරම්භ වී ක්‍රමයෙන් තුනී හා විනිවිද යන දේ කරා යොමු වෙයි. මෙහි දී ආකාසයට වඩා විඤ්ඤාණය සියුම් බවත්, අභ්‍යන්තර ආකාශයට අනුරූපවන බවත් පෙනේ. සමාධිය වැඩීමේ දී භාවනායෝගී වූ ආකාශය ගැන මෙනෙහි කිරීමට යොමු වෙයි. ඉන් අනතුරුව විඤ්ඤාණය පිළිබඳ අභ්‍යන්තර ආකාශය අනන්තය කරා විහිදුවා අනන්ත වූ විඤ්ඤාණය

---

තත්‍ථ විඤ්ඤාණන්ති කර්ම විඤ්ඤාණම්පි අභිසංඛාර විඤ්ඤාණම්පි.

අජ්ඣත්තිකඤ්ච බහිද්ධාච - වෙදනං නාභිනන්දිතො
එවං සතස්ස චරතො - විඤ්ඤාණං උපරුජ්ඣති.

දී.නි. අටුවා. ප්‍රථම භාගය. කේවට්ඨ සුත්ත වණ්ණනා, පි. 255.

38 අත්‍ථං විනාසං උපච්ඡේදං

උදානට්ඨ කථා, පි. 435.

39 නිස්සට්ඨෙන .... පඤ්චෙහි ඉන්ද්‍රියෙහි මනොවිඤ්ඤාණෙන.

ම.නි. I, පි. 293.

40 එත්‍ථ ආපො ච පඨවි තෙජො එත්‍ථ නාමං ච රූපං ච අසෙසං උපරුජ්ඣති.

දී.නි. I, පි. 223.

41 ම.නි. III, පි. 329.

පිළිබඳ අදහස් සාක්ෂාත් කරගැනීමට උත්සාහ දරයි. ඔහු "මම මේ අවස්ථා මනස හිස් කිරීමට දරණ ප්‍රයත්නයක් සේ සළකමි. බාහිර ආකාශය හිස් වශයෙන් ද සජානීය වශයෙන් ද චිත්තරූපයක් ආකාශය වෙත අවධානය යොමු කිරීමෙන් ශූන්‍යතාව හා සීමාරහිතභාවය ගැන වඩාත් උසස් අවස්ථාවක් කරා ළඟාවිය හැකිය." යනුවෙන් මෙනෙහි කරනු ලබයි.